සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved

**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - Sabaragamuwa**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2022 නොවැම්බර්**
**General Certificate of Education (Adv. Level) Examination - November 2022**

**13 ශ්‍රේණිය - දෙවන වාර පරීක්ෂණය - 2022**

| | | |
|---|---|---|
| **රසායන විද්‍යාව I**<br>**Chemistry I** | **02 S I** | **පැය දෙකයි**<br>**Two hours** |

- සාර්වත්‍ර වායු නියතය $R = 8.314\ J\ K^{-1}\ mol^{-1}$
- ඇවගාඩ්රෝ නියතය $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$
- ප්ලාන්ක් නියතය $h = 6.626 \times 10^{-34}\ J\ S$
- ආලෝකයේ ප්‍රවේගය $= 3 \times 10^{8}\ ms^{-1}$

**01.** පහත දැක්වෙන කවර මූලද්‍රව්‍ය යුගලයෙහි, එක සමාන වියුග්ම ඉලෙක්ට්‍රෝන සංඛ්‍යා පවතීද?
**(1)** Cr , Co **(2)** Fe , Co **(3)** V , Co **(4)** V , Cr **(5)** Cr , Mn

**02.** පරමාණුවක ප්‍රධාන ක්වොන්ටම් අංකය $n = 3$ හා ආශ්‍රිත උපරිම ඉලෙක්ට්‍රෝන යුගල් සංඛ්‍යාව වනුයේ,
**(1)** 3 **(2)** 4 **(3)** 5 **(4)** 8 **(5)** 9

**03.**  හි නිවැරදි IUPAC නාමය වන්නේ,

22 A/L අපි [ papers grp ]

**(1)** 5 – formyl – 4 – phenylpent – 3 – enamide

**(2)** 5 – oxo – 4 – phenylpent – 3 – enamide

**(3)** 4 – formyl – 4 – phenyl – 3 – butenamide

**(4)** 4 – formyl – 4 – phenyl – 3 – pentenamide

**(5)** 5 – amino – 5 – oxo – 4 – phenyl – 2 – pentenal

**04.** පහත දැක්වෙන පද්ධතිවල අන්තර් අණුක ආකර්ෂණ බලවල ප්‍රබලතාවය වැඩිවන පිළිවෙල වනුයේ,

**(a)** $NaCl_{(aq)}$ **(b)** $H_2O$ හා එතනෝල් මිශ්‍රණයක්

**(c)** $CO_{2\,(l)}$ **(d)** $I_2$ හා ඇසිටෝන් මිශ්‍රණයක්

**(1)** c < d < b < a **(2)** c < d < a < b **(3)** c < a < d < b

**(4)** d < c < b < a **(5)** d < c < a < b

**05.** $PCl_4^+$ , $PCl_3$ හා $PCl_6^-$ හි හැඩයන් වනුයේ පිළිවෙලින්,

**(1)** සීසෝ , ත්‍රි ආනති ද්විපිරමිඩාකාර හා අෂ්ටතලාකාර ය.

**(2)** චතුස්තලාකාර , ත්‍රි ආනති ද්විපිරමීඩාකාර හා අෂ්ටතලාකාර ය.

**(3)** සීසෝ , තලීය ත්‍රිකෝණාකාර හා සමචතුරස්‍ර පිරමීඩාකාර ය.

**(4)** චතුස්තලාකාර , පිරමීඩාකාර හා අෂ්ටතලාකාර ය.

**(5)** චතුස්තලාකාර , තලීය ත්‍රිකෝණාකාර හා අෂ්ටතලාකාර ය.



Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved

**06.** ස්ට්‍රොන්ටියම් ලෝහයේ පරමාණුක වර්ණාවලිය 662 nm හිදී වර්ණාවලි රේඛාවක් පෙන්නුම් කරයි. මෙයට අදාල විකිරණයේ පෝටෝනයක ශක්තිය සහ එය විද්‍යුත් චුම්භක වර්ණාවලියේ අයත්වන පරාසය නිවැරදිව දක්වා ඇත්තේ,

(1) $3\times10^{-19}$ J , අධෝරක්ත (2) $3\times10^{-28}$ , දෘශ්‍ය (3) $3\times10^{-19}$ J , දෘශ්‍ය

(4) $3\times10^{-28}$ , පාරජම්බුල (5) $3\times10^{-19}$ J , පාරජම්බුල

**07.** ඝනත්වය 1.8 $gcm^{-3}$ ක් වූ $H_2SO_4$ ද්‍රාවණයක 5 $cm^3$ ක් උදාසීන කිරීමට 2 $moldm^{-3}$ NaOH ද්‍රාවණයකින් 84.6 $cm^3$ ක් වැය විය. ස්කන්ධය අනුව අම්ල ද්‍රාවණයේ ප්‍රතිශත සංශුද්ධතාවය වනුයේ,

(1) 66 % (2) 16.9% (3) 33% (4) 92 % (5) 80.4 %

**08.** නිවැරදි වගන්තිය තෝරන්න.

(1) $NH_4^+$ හි ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය හා හැඩය එකිනෙකින් වෙනස් ය.

(2) H , He, Li, Be සහ B යන පරමාණු වල පළමු අයනිකරණ ශක්තිය අඩුවන පිළිවෙළ වනුයේ, He > Be > H > Li > B ය.

(3) $NO_3^-$ , $NO_2^+$ හා $NO_2^-$ යන අයන අතුරෙන් වැඩිම බන්ධන දිග ඇත්තේ $NO_2^-$ වලය.

(4) $NF_3$ ට වඩා $NH_3$ හි බන්ධන කෝණය වැඩිවන අතර $PF_3$ ට වඩා $PH_3$ හි බන්ධන කෝණය අඩු වේ.

(5) HCHO , HCOOH , $CCl_4$ හා $CH_3NH_2$ යන අණු අතරින් C පරමාණුවෙහි විද්‍යුත් ඍණතාවය වැඩිම වන්නේ HCHO හිය.

22 A/L අපි [ papers grp ]

**09.** $^{c}H-C\equiv C-CH(OH_{b})-CH_2-C(=O)-CH_3{}^{a}$

ඉහත සංයෝගයේ a , b , c ලෙස සලකුණු කර ඇති H පරමාණුවල ආම්ලිකතාවය වැඩිවන පිළිවෙළ නිවැරදිව දක්වා ඇත්තේ පහත කවරකද?

(1) a < b < c (2) b < c < a (3) c < b < a

(4) b < a < c (5) c < a < b

**10.** රේචනය කරන ලද බඳුනක් තුලට $A_{(g)}$ හා $D_{(g)}$ මිශ්‍රණයක් T උෂ්ණත්වයේදී ඇතුල් කරන ලදී. ආරම්භක පීඩනය p වේ. මේවා පහත ආකාරයට මූලික ප්‍රතික්‍රියා අනුව සම්පූර්ණයෙන් වියෝජනය වූ විට පීඩනය 2.5 p විය.

$$A_{(g)} \rightarrow B_{(g)} + 2C_{(g)}$$

$$2D_{(g)} \rightarrow B_{(g)} + 3C_{(g)}$$

$A_{(g)}$ හි වියෝජනයේ ආරම්භක සීඝ්‍රතාවය වනුයේ,

(1) $K\left(\frac{P}{RT}\right)$ (2) $0.5K\left(\frac{P}{RT}\right)$ (3) $2.5K\left(\frac{P}{RT}\right)$ (4) $1.5K\left(\frac{P}{RT}\right)$ (5) $2.0K\left(\frac{P}{RT}\right)$



Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved

**11.** propanal , තනුක NaOH හමුවේදී ස්වයං සංගනනයට ලක්කර $I_2$ දමා උණුසුම් කරන ලදී. ලැබෙන ඵලය මින් කුමක් විය හැකිද?

**(1)** $CH_3-CH_2-CH(OH)-CH(CH_3)-CHO$

**(2)** $CH_3-CH_2-CH(CHO)-CH_2=CH_2$

**(3)** $CH_3-CH_2-C(H)=C(CH_3)-CHO$

**(4)** $CH_3-CH=CH-CH=CH-CH_3$

**(5)** $CH_3CH_2CH=CHCH_2CHO$

**12.** X නමැති කාබනික සංයෝගයේ 6.56g ක් උචිත ලෙස දහනය කරන ලදී. එහිදී ඵල වශයෙන් $CO_2$ 14.08g ක් ද $H_2O$ 4.32 g ද $N_2$ ද ලැබුණි. X හි මවුලික ස්කන්ධය 164 g $mol^{-1}$ නම් X හි 1.0 mol දහනය කිරීම සඳහා ඉහත තත්ත්ව යටතේ ද අවශ්‍ය $O_2$ ප්‍රමාණය මින් කුමක්ද? ( N=14 , O=16 , C=12 )

**(1)** 4.0 mol **(2)** 6.0 mol **(3)** 7.0 mol **(4)** 9.0 mol **(5)** 11.0 mol

**13.** සාන්ද්‍රණය 0.1 $moldm^{-3}$ වූ $BaCl_2$ ද්‍රාවණ 50 $cm^3$ කට සාන්ද්‍රණය 0.1 $moldm^{-3}$ වූ $AgNO_3$ 50 $cm^3$ ක් ක්‍රමයෙන් එකතු කරන ලදී. එකතු කළ පරිමාව සමඟ $[Cl^-]$ විචලනය නිවැරදිව දක්වනුයේ,

**(1)**



**(2)**



**(3)**



**(4)**



**(5)**



.22 A/L අපි [ papers grp ]

**14.** A, 350 K ට ඉහළ උෂ්ණත්ව වලදී පහත ආකාරයට භාගිකව විඝටනය වේ.

$$A_{(s)} \rightleftharpoons 2B_{(g)} + C_{(g)}$$

A හි යම්කිසි මවුල ප්‍රමාණයක් සංවෘත භාජනයක 400 K දී සමතුලිතතාවයට පත්වූයේ නම්, B හි ආංශික පීඩනය විය හැක්කේ, $K_P = 3.2 \times 10^{13} pa^3$

**(1)** $1.6 \times 10^4$ pa **(2)** $1.6 \times 10^3$ pa **(3)** $4.0 \times 10^4$ pa

**(4)** $2.0 \times 10^4$ pa **(5)** $8 \times 10^4$ pa


Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved

**15.** සංවෘත බඳුනක් තුළ යම් A වායු මවුල ප්‍රමාණයක් T උෂ්ණත්වය දක්වා රත්කර නියත උෂ්ණත්වයක තබන ලදී. එවිට, පහත දැක්වෙන පරිදි A වියෝජනය වේ.

$$2A_{(g)} \rightarrow C_{(g)} + 2B_{(g)}$$

මෙම මූලික ප්‍රතික්‍රියාව පිළිබඳ **අසත්‍ය** වන්නේ,

**(1)** ප්‍රතික්‍රියාවේ A වැයවන සීඝ්‍රතාවය, B සෑදෙන සීඝ්‍රතාවයට සමානය.

**(2)** ප්‍රතික්‍රියාවේ අර්ධ ජීව කාලය, $A_{(g)}$ හි ආරම්භක සාන්ද්‍රණය මත රඳා පවතී.

**(3)** ප්‍රතික්‍රියාවේ සීඝ්‍රතා නියතය $A_{(g)}$ හි සාන්ද්‍රණය මත රඳා පවතී.

**(4)** කාලයත් සමඟ ප්‍රතික්‍රියාවේ වේගය අඩු වේ.

**(5)** කාලයත් සමඟ A හි සඵල ගැටුම් භාගය වෙනස් නොවේ.

.22 A/L අපි [ papers grp ]

**16.** A නම් ඇරෝමැටික සංයෝගය පහත නිරීක්ෂණ සියල්ලම පෙන්වයි.

**1.** බ්‍රෝමීන් ජලය විවර්ණ කරයි.

**2.** සෝඩියම් ලෝහය සමඟ $H_2$ මුක්ත කරයි.

**3.** ඇමෝනිය සිල්වර් නයිට්‍රේට් සමඟ සුදු අවක්ෂේපයක් ලබා දේ.

මෙම සංයෝගය විය හැක්කේ,

**(1)** 

**(2)** 

**(3)** 

**(4)** 

**(5)** 

**17.** දී ඇති උෂ්ණත්වයේදී A වායුවේ ඝනත්වය , B වායුවේ ඝනත්වය මෙන් දෙගුණයකි. B වායුවේ මවුලික ස්කන්ධය, A වායුවේ මවුලික ස්කන්ධය මෙන් හතර ගුණයකි. A හා B වායුවල පීඩන පිළිවෙලින් $P_A$ හා $P_B$ නම් එම පීඩනවල අනුපාතය,

**(1)** $\frac{P_A}{P_B} = \frac{1}{8}$ **(2)** $\frac{P_A}{P_B} = \frac{1}{4}$ **(3)** $\frac{P_A}{P_B} = 1$

**(4)** $\frac{P_A}{P_B} = 4$ **(5)** $\frac{P_A}{P_B} = 8$

**18.** $0.25\ mol\ dm^{-3}$ $(NH_4)_3PO_4$ ද්‍රාවණ $25\ cm^3$ ක් $500\ cm^3$ ක් දක්වා ජලයෙන් තනුක කළ විට ලැබෙන ද්‍රාවණයේ ජලීය $NH_4^+$ අයන සංයුතිය ppm වලින්,

( P = 31 , O = 16 , N = 14 , H = 1 )

**(1)** 1350 **(2)** 5137 **(3)** 4500 **(4)** 675 **(5)** 600



Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved

**19.** $CaCl_{2(s)}$ හි සම්මත දැලිස බිඳීමේ එන්තැල්පිය 2337 KJ $mol^{-1}$ වේ. $Ca^{2+}_{(g)}$ හා $Cl^{-}_{(g)}$ හි සම්මත සජලන එන්තැල්පි පිළිවෙලින් −1650 හා −364 KJ $mol^{-1}$ බැගින් වේ. $CaCl_{2(s)}$ හි සම්මත ද්‍රාවණ එන්තැල්පිය,

**(1)** − 41 KJ $mol^{-1}$ **(2)** −323 KJ $mol^{-1}$ **(3)** −284 KJ $mol^{-1}$

**(4)** +323 KJ $mol^{-1}$ **(5)** +41 KJ $mol^{-1}$

**20.** එතීන් හා HBr අතර ප්‍රතික්‍රියාවේ නිවැරදි පියවරක් දක්වා ඇත්තේ පහත කවරකද?

**(1)** 

**(2)** 

**(3)** 

**(4)** 

**(5)** 

22 A/L අපි [ papers grp ]

**21.** වායු පිළිබඳ චාලක අණුක වාදයට අනුව පරිපූර්ණ වායු නියැදියක් සඳහා මින් කවර ප්‍රකාශය සත්‍ය වේද?

**(1)** වායු අණුවක මධ්‍යන්‍ය චාලක ශක්තිය නිරපේක්ෂ උෂ්ණත්වයට ප්‍රතිලෝමව සමානුපාතික වේ.

**(2)** වර්ග මධ්‍යන්‍ය මූල ප්‍රවේගය වායු වර්ගය මත රඳා පවතී.

**(3)** නියත උෂ්ණත්වයේදී වායු අණුවක මධ්‍යන්‍ය චාලක ශක්තිය පීඩනයේ වෙනස් කිරීම මත රඳා නොපවතී.

**(4)** නියත උෂ්ණත්වයේදී වායු අණු අතර සිදුවන ගැටුම් නිසා මුලු චාලක ශක්තිය වෙනස් වේ.

**(5)** වායු අණුවක පරිමාව භාජනයේ පරිමාව සමඟ සසඳන විට නොසලකා හැරිය නොහැක.

**22.** $SO_3^{2-}$ අයනය $IO_3^{-}$ මගින් $SO_4^{2-}$ බවට පත්වීමේදී $I_2$ ලැබෙන්නේ නම් 0.1 mol $dm^{-3}$ $Na_2SO_3$ ද්‍රාවණයක 25 $cm^3$ ක් ඔක්සිහරණයට අවශ්‍ය $KIO_3$ ස්කන්ධය වනුයේ, (K = 39 , O = 16 , I = 127 )

**(1)** 2.14 g **(2)** 21.4 g **(3)** 0.0214 g **(4)** $2.1 \times 10^{-4}$ g **(5)** 0.214 g

**23.** $8.2 \times 10^5$ $Nm^{-2}$ පීඩනයක් යටතේ පරිමාව 20 $dm^3$ ක් වන බඳුනක් තුළ පරිපූර්ණ වායුවකින් 2.0 mol ක් අන්තර්ගත වේ. වායු අණුවල වර්ග මධ්‍යන්‍ය මූල ප්‍රවේගය 820 $ms^{-1}$ වේ. වායුවේ මවුලික ස්කන්ධය වන්නේ,

**(1)** 44 g $mol^{-1}$ **(2)** 37 g $mol^{-1}$ **(3)** 16 g $mol^{-1}$ **(4)** 4 g $mol^{-1}$ **(5)** 2 g $mol^{-1}$



Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved

**24.** සාන්ද්‍රණය 0.2 mol $dm^{-3}$ $RNH_2$ ද්‍රාවණ 50 $cm^3$ කට සාන්ද්‍රණය 0.2 mol $dm^{-3}$ HCl ද්‍රාවණ 50 $cm^3$ ක් මිශ්‍ර කළ විට ලැබුනු ද්‍රාවණයේ pH අගය ලබා දෙන නිවැරදි ප්‍රකාශය වන්නේ,

R $NH_2$ භෂ්මයේ අයනිකරණ නියතය $K_1$ ද ජලයේ විඝටන නියතය $K_2$ ද වේ.

**(1)** $PK_2 = \dfrac{PK_1 + 1}{2}$ **(2)** $\dfrac{PK_2 + 1}{PK_1}$ **(3)** $\dfrac{PK_2 - PK_1 + 1}{2}$

**(4)** $\dfrac{PK_1 + PK_2 + 1}{2}$ **(5)** $\dfrac{PK_1}{PK_2}$

**25.** N හා P සම්බන්ධයෙන් වන පහත කුමන ප්‍රකාශය අසත්‍ය වේද?

**(1)** $HNO_2$ මෙන්ම $H_3PO_2$ ද ඒක භාෂ්මික අම්ලයකි.

**(2)** $NH_3$ හා $PH_3$ ලෙස වායුමය සංයෝග දෙකක් සාදයි.

**(3)** මූලද්‍රව්‍ය දෙකම උපරිම ඔක්සිකරණ අංකයෙන් සාදන ඔක්සයිඩ ආම්ලික වේ.

**(4)** $NCl_3$ හා $PCl_3$ හිදි N හා P හි ඔක්සිකරණ අංක එක සමානය.

**(5)** කාමර උෂ්ණත්වයේදී නයිට්‍රජන් හා පොස්පරස් වායුගෝලීය ඔක්සිජන් සමඟ ප්‍රතික්‍රියා නොකරයි.

**26.** මැග්නීසියම් (Mg) මූල ද්‍රව්‍යය හා එහි සංයෝග සම්බන්ධව පහත සඳහන් කුමන ප්‍රකාශය වැරදි වේද?

**(1)** එහි ඔක්සයිඩය භාස්මික වේ.

**(2)** මැග්නීසියම් වාතයේ රත් කළ විට ඵල දෙකක් සාදයි.

**(3)** කාමර උෂ්ණත්වයේදී සිසිල් ජලය සමඟ ප්‍රතික්‍රියා නොකරයි.

**(4)** $Mg(NO_3)_{2(s)}$ තාප වියෝජනයෙන් ලැබෙන්නේ වායුමය ඵල එකක් පමණි.

**(5)** $MgCl_2$ ජලීය ද්‍රාවණයක් ආම්ලික වේ.

**27.** භාස්මික මාධ්‍යයේදී $MnO_4^-$ මගින් $M^{2+}$ , $MO^{n+}$ බවට ඔක්සිකරණය වේ. 1.2 mol$dm^{-3}$ $M^{2+}$ , 25 $cm^3$ ක් සමඟ ක්‍රියාකිරීමට, 1.25 mol $dm^{-3}$ $KMnO_4$ ද්‍රාවණ 40 $cm^3$ ක් වැය විය. n හි අගය වනුයේ,

**(1)** 1 **(2)** 2 **(3)** 3 **(4)** 4 **(5)** 5

.22 A/L අපි [ papers grp ]

**28.** පහත සඳහන් ප්‍රතික්‍රියාව සලකන්න.

$$A_{(g)} + B_{(g)} \rightleftharpoons C_{(g)} + D_{(g)} \; ; \Delta H = +100 \text{ KJ mol}^{-1}$$

මේ ප්‍රතික්‍රියාවේදී D හි ඵලදාව මින් කුමකින් වැඩි කෙරේද?

**(1)** පද්ධතියේ සමස්ත පීඩනය වැඩි කිරීමෙන්.

**(2)** පද්ධතියේ සමස්ත පීඩනය අඩු කිරීමෙන්.

**(3)** පද්ධතියේ උෂ්ණත්වය අඩු කිරීමෙන්.

**(4)** පද්ධතියෙන් B ඉවත් කිරීමෙන්.

**(5)** ඉහත කිසිවක් මගින් D හි ඵලදාව වැඩි නොකෙරේ.



Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved

**29.** 3d මූලද්‍රව්‍ය හා එහි සංයෝග සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

**(1)** ඒවායේ ප්‍රතික්‍රියාශීලීත්වය s ගොණුවේ මූලද්‍රව්‍යවලට වඩා අඩුය.

**(2)** සියළුම මූලද්‍රව්‍යයන්ට +2 ඔක්සිකරණ තත්වය පෙන්විය හැකිය.

**(3)** ඒවායේ සංයෝග බොහොමයකට උත්ප්‍රේරක ලෙස ක්‍රියාකල හැක.

**(4)** s ගොණුවේ මූලද්‍රව්‍යවලට වඩා වැඩි විද්‍යුත් සෘණතාවක් ඇත.

**(5)** ඒවා සාදන සංකීර්ණ සංයෝග සියල්ලම පාහේ වර්ණවත් නොවේ.

**30.**



සංයෝගය වැඩිපුර ජලීය KOH සමඟ උණුසුම් කරන ලදී. එහිදී සෑදිය හැකි එල මින් කුමක් විය හැකිද?

22 A/L අපි [papers grp

**(1)**  , $NH_3$

**(2)**  , $NH_3$

**(3)**  , $NH_3$

**(4)**  , $NH_3$

**(5)** 



Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved

**ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් උපදෙස්.**

| (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|
| *(a) සහ (b)* පමණක් **නිවැරදියි.** | *(b) සහ (c)* පමණක් **නිවැරදියි.** | *(c) සහ (d)* පමණක් **නිවැරදියි.** | *(d) සහ (a)* පමණක් **නිවැරදියි.** | **වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදියි.** |

**31.** ප්‍රකාශ සක්‍රිය සංයෝගයක් වන A සලකන්න.




.22 A/L අපි [ papers grp ]

A ණුව සම්බන්ධයෙන් සත්‍ය වනුයේ,

**(a)** $NaNO_2/HCl$ සමඟ ලබාදෙන ඵලය ප්‍රකාශ සක්‍රිය වේ.

**(b)** PCC සමඟ ලබා දෙන ඵලය ප්‍රකාශ සක්‍රිය වේ.

**(c)** A, $Br_2$ දියරය විවර්ණ නොකරයි.

**(d)** NaOH සමඟ ක්‍රියා නොකරයි.

**32.** පහත සඳහන් කුමන ප්‍රකාශය/ප්‍රකාශ අසත්‍ය වේද?

**(a)** පරමාණුව පිළිබඳ පළමු න්‍යෂ්ටික ආකෘතිය තොම්සන් විසින් යෝජනා කරන ලදී.

**(b)** කැතෝඩ කිරණ නළය තුළ ඇති වායුව අනුව ධන කිරණවල e/m අගය වෙනස් නොවේ.

**(c)** රන්පත් පරීක්ෂාව සඳහා He අංශුවලට සමාන අංශු විශේෂයක් යොදාගන්නා ලදී.

**(d)** එකම අවස්ථාවේදී ඉලෙක්ට්‍රෝන තරංගමය හා අංශුමය ලෙස හැසිරේ.

**33.** පහත ඒවායින් කුමක් ද්විධාකරණ ප්‍රතික්‍රියා නොවේද?

**(a)** $Cl_{2(aq)} + 2Br^-_{(aq)} \rightarrow 2Cl^-_{(aq)} + Br_{2(aq)}$

**(b)** $S_2O_3^{2-} + 2H^+_{(aq)} \rightarrow SO_{2(g)} + S_{(s)} + H_2O_{(l)}$

**(c)** $2H_2O_{2(aq)} \rightarrow 2H_2O_{(l)} + O_{2(g)}$

**(d)** $2Cu^+_{(aq)} \rightarrow Cu_{(s)} + Cu^{2+}_{(aq)}$

**34.** පහත සඳහන් කුමන ද්‍රව්‍යවල ජලීය ද්‍රාවණයක් ආම්ලික වේද?

**(a)** $C_2H_5ONa$ **(b)** $AlCl_3$ **(c)** $NH_4Cl$ **(d)** $CH_3COONH_4$



Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved

**35.** ෆීනෝල් සම්බන්ධයෙන් වන පහත කවර වගන්තිය/වගන්ති සත්‍ය වේද?

**(a)** $Na_2CO_3$ සමඟ පිරියම් කළ විට $CO_2$ පිට කරයි.

**(b)** $CH_3COOH$ අම්ලය සමඟ ෆීනයිල් එස්ටරය සාදයි.

**(c)** බ්‍රෝමීන් දියර සමඟ සුදු පැහැ අවක්ෂේපයක් සාදයි.

**(d)** ක්ෂාරීය මාධ්‍යයේදී ඩයසෝනියම් ලවණය සමඟ වර්ණවත් සායමක් සාදයි.

.22 A/L අපි [ papers grp ]

**36.** පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේද?

**(a)** මූලික ප්‍රතික්‍රියාවක පෙළ පූර්ණ සංඛ්‍යාවක් වේ.

**(b)** ප්‍රතික්‍රියාවක, එක් එක් ප්‍රතික්‍රියකය අනුබද්ධයෙන් පෙළ, තුලිත සමීකරණයෙහි ඇති ස්ටොයිකියෝමිතිය මගින් නිර්ණය කළ හැක.

**(c)** ශුන්‍ය පෙළ ප්‍රතික්‍රියාවක සීඝ්‍රතාවය සැමවිටම නියතයකි.

**(d)** ප්‍රතික්‍රියාවක පෙළ පරීක්ෂණාත්මකව නිර්ණය කළ යුතුමය.

**37.** ආවර්තිතා වගුවේ 15 වන කාණ්ඩය සම්බන්ධව පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේද?

**(a)** කාණ්ඩයේ පහළට යන විට ලෝහක ගුණය වැඩි වේ.

**(b)** $SbCl_3$ වැඩිපුර ජලයේ ද්‍රවණය වී පැහැදිලි ආම්ලික ද්‍රාවණයක් සාදයි.

**(c)** $NH_3$ සිට $SbH_3$ දක්වා ඇති හයිඩ්‍රයිඩවල තාපාංකය ක්‍රමයෙන් වැඩි වේ.

**(d)** $NCl_3$ ජලීය ද්‍රාවණයක් විරංජන ගුණ දක්වයි.

**38.** වායු සම්බන්ධයෙන් සත්‍ය වන්නේ පහත කවර වගන්තිය/වගන්තිද?

**(a)** පරිපූර්ණ වායු අණු සතු සමස්ත ස්කන්ධය නොගිනිය හැකිය.

**(b)** නියත පීඩනයේදී පරිපූර්ණ වායුවක උෂ්ණත්වය 300K සිට 400K දක්වා ඉහළ නැංවීමේදී පරිමාව දෙගුණ වේ.

**(c)** තාත්වික වායුවක් පරිපූර්ණ හැසුරුමෙන් දක්වන අපගමනය මැනීමට සම්පීඩ්‍යතා සංගුණකය යොදාගනු ලැබේ.

**(d)** තාත්වික වායුවකින් පරිපූර්ණ හැසුරුම අපේක්ෂා කළ හැකි තත්ව වන්නේ ඉතා අඩු පීඩන සහ ඉහළ උෂ්ණත්වයන්ය.

**39.** පහත දී ඇති ප්‍රකාශවලින් කුමක්/කුමන ඒවා සත්‍ය වේද?

**(a)** $\Delta H < O$ සහ $\Delta S > O$ වන ප්‍රතික්‍රියා සෑම විටම ස්වයංසිද්ධ වේ.

**(b)** $\Delta H > O$ සහ $\Delta S > O$ වන ප්‍රතික්‍රියා සෑම විටම ස්වයංසිද්ධ වේ.

**(c)** $\Delta H > O$ සහ $\Delta S > O$ වන ප්‍රතික්‍රියා සියලු උෂ්ණත්වවලදී ස්වයංසිද්ධ නොවේ.

**(d)** $\Delta H < O$ සහ $\Delta S > O$ වන ප්‍රතික්‍රියා අඩු උෂ්ණත්වවලදී ස්වයංසිද්ධ වේ.



Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved

**40.** $T_1$ සහ $T_2$ යන උෂ්ණත්ව වල දෘඪ බඳුන් දෙකක ඇති $X_{(g)}$ හි ආරම්භක සාන්ද්‍රණ සමාන වේ. $X_{(g)}$ පහත සමතුලිතයට ලක්වේ.

$X_{(g)} \rightleftharpoons 2Y_{(g)}$

කාලය සමඟ මෙම උෂ්ණත්ව දෙකට අදාල X හා Y හි සාන්ද්‍රණ විචලන වන ආකාරය පහත ප්‍රස්තාරයෙන් නිරූපණය කෙරේ.

එහි $T_1$ උෂ්ණත්වයේදී X හා Y හි සාන්ද්‍රණ විචලන සෘජු රේඛා (–) මගින් ද,

$T_2$ උෂ්ණත්වයේදී X හා Y හි සාන්ද්‍රණ විචලන කඩ ඉරි (----) මගින් ද නිරූපණය කෙරේ.




මේ සම්බන්ධව පහත කුමන එක/ඒවා සත්‍ය වේද?

**(a)** $T_2 < T_1$

**(b)** $T_2 > T_1$

**(c)** ඉදිරි ප්‍රතික්‍රියාව තාප අවශෝෂක වේ.

**(d)** ඉදිරි ප්‍රතික්‍රියාව තාපදායක වේ.

.22 A/L අපි [ papers grp ]



Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved

## ප්‍රශ්ණ අංක 41 සිට 50 තෙක් උපදෙස්

| ප්‍රතිචාරය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය වේ. | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය නිවැරදිව පහදා දෙයි. |
| (2) | සත්‍ය වේ. | සත්‍ය වන නමුත් පළමුවැනි ප5කාශය නිවැරදිව පහදා නොදෙයි. |
| (3) | සත්‍ය වේ. | අසත්‍ය වේ. |
| (4) | අසත්‍ය වේ. | සත්‍ය වේ. |
| (5) | අසත්‍ය වේ. | අසත්‍ය වේ. |

.22 A/L අපි [ papers grp ]

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **41.** | $AgNO_3$ හා $Zn(NO_3)_2$ ද්‍රාවණ දෙකක් වෙන් කර හඳුනා ගැනීමට ජලීය $NH_3$ ද්‍රාවණයක් යොදාගත නොහැක. | $Ag^+$ හා $Zn^{2+}$ යන දෙකම ජලය සමඟ ද්‍රාව්‍ය ඇමීන් සංකීර්ණ සාදයි. |
| **42.** | කිසියම් ප්‍රතික්‍රියාවක ΔG සඳහා ලැබෙන (–) අගය වැඩිවන විට ප්‍රතික්‍රියාව වඩ වඩාත් ඵලදායි වේ. | ΔG සඳහා ලැබෙන (–) අගය වැඩිවත්ම ප්‍රතික්‍රියා සීඝ්‍රතාවය වැඩි වේ. |
| **43.** | $Cl_{2(g)}$ , $KOH_{(aq)}$ සමඟ ක්‍රියාවෙන් Cl මත ඔක්සිකරණ අංකය ධන මෙන්ම සෘණ වන සංයෝග මිශ්‍රණයක් ලැබේ. | ප්‍රතික්‍රියා තත්ව අනුව, $Cl_2$ වායුව හා KOH වලින් ලැබෙන ඵල වෙනස් වේ. |
| **44.** | උත්ප්‍රේරකයක් මගින් ඉදිරි හා පසු ප්‍රතික්‍රියාවල සක්‍රියන ශක්ති එකම ප්‍රමාණයකින් අඩු කරයි. | උත්ප්‍රේරකයක් මගින් ප්‍රතික්‍රියාවක කාර්යක්ෂමතාවය ඉහළ නංවයි. |
| **45.** | 2,3–dimethylbutane හි තාපාංකය, hexane හි තාපාංකයට වඩා වැඩිය. | ඇල්කේනයක අංශුදාම වැඩිවන විට අණුවේ පෘෂ්ඨීක ක්ෂේත්‍රඵලය වැඩි වේ. |
| **46.** | ඇරිල් හේලයිඩවල C–X බන්ධනය, ඇල්කිල් හේලයිඩ වල C–X බන්ධනය තරම් ධ්‍රැවිකරණය වී නැත. | $sp^2$ මුහුම්කරණයට ලක් වූ C පරමාණු, $sp^3$ මුහුම්කරණයට ලක්වූ C පරමාණුවලට වඩා විද්‍යුත් සෘණතාවයෙන් ඉහළයි. |
| **47.** | $H_{2(g)} + Cl_{2(g)} \rightleftharpoons 2HCl_{(g)}$ යන සමතුලිතයේ පරිමාව අර්ධ කළ විට සමතුලිත ලක්ෂ්‍යය වෙනස් වේ. | මෙහි පරිමාව අර්ධ කළ විට ඉදිරි ප්‍රතික්‍රියා සීඝ්‍රතාවයත්, පසු ප්‍රතික්‍රියා සීඝ්‍රතාවයත් යන දෙකම වැඩි වේ. |
| **48.** | ඇනිලින්, ඇසිටමයිඩ් ට වඩා භාෂ්මිකතාවයෙන් වැඩිය. | ඇසිටමයිඩ් ට සාපේක්ෂව ඇනිලින් සඳහා වැඩි සම්ප්‍රයුක්ත ව්‍යූහ ගනනක් පවතී. |
| **49.** | $NH_2^-$ හා $NH_3$ යනු සංයුග්මක අම්ල – භස්ම යුගලයකි. | එක් ප්‍රෝටෝනයකින් පමණක් එකිනෙකින් වෙනස් වන්නා වූ අම්ල – භස්ම යුගලයක් සංයුග්මක අම්ල – භස්ම යුගලයකි. |
| **50.** | සමතුලිතතා ලක්ෂ්‍යය වෙනස් වන සෑම විටම සමතුලිතතා නියතයද වෙනස් වේ. | සමතුලිතතා නියතය වෙනස් වන සෑම විටම සමතුලිතතා ලක්ෂ්‍යයද වෙනස් වේ. |



Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved

# ආවර්තිතා වගුව

.22 A/L අපි [papers grp]

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 H | | | | | | | | | | | | | | | | | 2 He |
| 2 | 3 Li | 4 Be | | | | | | | | | | | 5 B | 6 C | 7 N | 8 O | 9 F | 10 Ne |
| 3 | 11 Na | 12 Mg | | | | | | | | | | | 13 Al | 14 Si | 15 P | 16 S | 17 Cl | 18 Ar |
| 4 | 19 K | 20 Ca | 21 Sc | 22 Ti | 23 V | 24 Cr | 25 Mn | 26 Fe | 27 Co | 28 Ni | 29 Cu | 30 Zn | 31 Ga | 32 Ge | 33 As | 34 Se | 35 Br | 36 Kr |
| 5 | 37 Rb | 38 Sr | 39 Y | 40 Zr | 41 Nb | 42 Mo | 43 Tc | 44 Ru | 45 Rh | 46 Pd | 47 Ag | 48 Cd | 49 In | 50 Sn | 51 Sb | 52 Te | 53 I | 54 Xe |
| 6 | 55 Cs | 56 Ba | La- Lu | 72 Hf | 73 Ta | 74 W | 75 Re | 76 Os | 77 Ir | 78 Pt | 79 Au | 80 Hg | 81 Tl | 82 Pb | 83 Bi | 84 Po | 85 At | 86 Rn |
| 7 | 87 Fr | 88 Ra | Ac- Lr | 104 Rf | 105 Db | 106 Sg | 107 Bh | 108 Hs | 109 Mt | 110 Ds | 111 Rg | 112 Cn | 113 Nh | 114 Fl | 115 Mc | 116 Lv | 117 Ts | 118 Og |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 57 La | 58 Ce | 59 Pr | 60 Nd | 61 Pm | 62 Sm | 63 Eu | 64 Gd | 65 Tb | 66 Dy | 67 Ho | 68 Er | 69 Tm | 70 Yb | 71 Lu |
| 89 Ac | 90 Th | 91 Pa | 92 U | 93 Np | 94 Pu | 95 Am | 96 Cm | 97 Bk | 98 Cf | 99 Es | 100 Fm | 101 Md | 102 No | 103 Lr |



Scanned with CamScanner